Article 13 (1)
13 (11)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date } 2019/07/19 |

පැමිණිලිකරු : ඩබ්. විජේසුන්දර මහතා,
පහල ගමමැද්ද,
මහ ඉඳුරුව.

වගඋත්තරකරුවන් : 01. උ.පො.ප. අයි.ජී.කීර්තිපාල මහතා,
පොලිස් ස්ථානය,
කොස්ගොඩ.

02. පො.ප ජී.පී.ඩී. සිල්වා මහතා,
පොලිස් ස්ථානය,
කොස්ගොඩ.

<u>පැමිණිලි අංක : HRC/3162/17</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, තමා තම අවිවාහක සහෝදරියන් දෙදෙනා සමග නිවසේ ජීවත්වන බවත්, 2017.07.29 වන දින අනුරාධපුරයේ පදිංචිව සිටින තම වැඩිමහල් සහෝයුරා තමා පදිංචිව සිටින නිවසට පැමිණ නිවසින් ඉවත්වන ලෙසට ප්‍රකාශ කළ බවත්, පැමිණිලිකරු විසින් එය ප්‍රතික්ෂේප කිරීමෙන් පසු ඔහු විසින් පොලිසියට ඒ බව දැන්වීමෙන් අනතුරුව කොස්ගොඩ පොලිසියෙන් පැමිණි නිලධරියා තමාගේ කම්මුලට පහර දී අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගොස් පසු දින ප.ව 3.00 දක්වා රඳවා තබා ගත් බවත්, පසුව ඇප මත නිදහස් කළ බවත්ය.

තවද, ප්‍රකාශයකට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ නිසා තමාගේ කම්මුලට පහර දුන් බවත් පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් තොරතුරු සටහන් පොත් වල උද්ධෘත සහිත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව කොස්ගොඩ පොලිස් ස්ථානයේ CIB II තොරතුරු සටහන් පොතෙහි 2017.07.29 වන දින පැය 20.50 ට පිටු අංක 128 ඡේද 224 යටතේ පැමිණිලිකරුට විරුද්ධව පැමිණිලිකරුගේ සොහොයුරා වන පියසිරි විජේසුන්දර පැමිණිල්ලක් දමා ඇති බවට තොරතුරු ඉදිරිපත් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் } 011-2505451
ෆැක්ස් / தொலைநகல் } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் } sechrc@sltnet.lk

**පැමිණිල්ල සම්බන්ධයෙන් 01 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති උ.පො.ප අයි.පී.කීර්තිපාල මහතාගේ කරුණු දැක්වීම :-**

තමා 2017.07.29 දින රාත්‍රී ජංගම සංචාරය භාරව කටයුතු කළ බවත්, එදින රාත්‍රියේ පැය 18.48ට පියසිරි විජේසුන්දර නමැති අය විසින් තම සහෝදරයා වන විල්සන් යන අය තමාට පහරදීමට තැත්කරන බවට සඳහන් කරන 119 පොලිස් පණිවිඩ 03 ක් එකම පුද්ගයාගෙන් ලැබී ඇති බවත්, ඒ අනුව අදාළ ස්ථානයට ගොස් පැමිණිල්ල සටහන් කරගත් බවත්, අනතුරුව විල්සන් ජයසුන්දර යන අයව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බවත්, අත්අඩංගුවට ගැනීම පැය 20.15 ට සිදුකළ අතර, පැය 20.35ට ස්ථානයට ඉදිරිපත් කරන ලද බවත්, සඳහන් කර ඇත.

කොමිෂන් සභාව විසින් වගඋත්තරකරුගෙන් කරන ලද පැහැදිලි කර ගැනීම් වලට අනුව අත්අඩංගුවට ගැනීමට පෙර අදාළ තොරතුරු සම්බන්ධයෙන් විමර්ශනයක් කළ බව ප්‍රකාශ කරන නමුත් අදාළ පැමිණිල්ලේ විල්සන් විජේසුන්දර යන අයට විරුද්ධව කිසිදු සාක්ෂියක් සටහන් කරගෙන නොමැති බව කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ.

**02 වන වගඋත්තරකරු වන පො.ප. පී.පී.පී.ඩී.සිල්වා මහතාගේ කරුණු දැක්වීම :-**

තමා කොස්ගොඩ පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ බවත්, එදින ස්ථානාධිපතිවරයා පොලිස් ස්ථානයේ සිටි බවත්, එම නිසා පොලිස් ස්ථානයේ වැඩ බැලීමක් සිදුකිරීමට අවශ්‍ය නොවූ බවත් කියා සිටී. 2017.07.30 වන දින උදේ 9.15 ට මෙම පැමිණිලිකරු වන පියසිලි විජේසුන්දර සහ සොයුරිය වන සරලා විජේසුන්දර යන අයත් පොලිස් ස්ථානයට පැමිණ සිටි බවත්, පො.සැ 28190 නිලධාරියා විසින් තමා වෙත ඔවුන් ඉදිරිපත් කළ අතර, ඒ වනවිට ස්ථානයේ අත්අඩංගුවේ සිටි වගඋත්තරකරු වන විල්සන් විජේසුන්දර යන අය තමා වෙත ඉදිරිපත් කළ අතර, තමා මොවුන් දෙදෙනාට සාමයෙන් සිටින ලෙසට අවවාද කර දෙපාර්ශවයේ අත්සන් ලබාගත් බවත් සඳහන් කර ඇත. ඒට පසුව 2017.07.30 වන දින පැය 15.30 ට අත්අඩංගුවේ සිටි විල්සන් විජේසුන්දර යන අයට ස්ථානාධිපතිතුමාගේ නියෝග පිට උපසේවයේ සිටි පො.කො 85146 විජේකොන් නිලධාරියා විසින් පුද්ගලික ඇප මත දැනුම් දුන් විටක පොලිස් ස්ථානයේ පෙනී සිටින ලෙස දන්වා මුදාහැර ඇති බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ල සම්බන්ධයෙන් කොස්ගොඩ, පොලිස් ස්ථානයේ ස්ථානාධිපති - පො.ප. ඩී.යූ.සිරිමාන්න යන අය 2018.06.08 වන දින කොමිසම ඉදිරියේ කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ ඔහු 2017.07.29 සහ 2017.07.30 යන දිනවල පොලිස් ස්ථානයේ නොසිටි බවත්, වවුනියාව අධිකරණයේ පවතින නඩුවකට ඉදිරිපත්වූ බවත්ය.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට පෙර පොලිස් ස්ථානයට හදිසි ඇමතුම් අංක 119 යටතේ ලද පැමිණිල්ල සම්බන්ධයෙන් එනම්, එම තොරතුර සම්බන්ධයෙන් 01 වන වගඋත්තරකරු අදාළ ස්ථානයට ගොස් නිසි විමර්ශනයක් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ. එනම් පැමිණිලිකරුට විරුද්ධව ඇති සාක්ෂි සටහන් කර ගැනීමක් හෝ පහරදීමක් සිදුකළ බවට කිසිදු තහවුරු කර

ගැනීමක් සිදු කර නොමැති බවට වගඋත්තරකරු විසින් යොදා ඇති විමර්ශන සටහන් පරීක්ෂා කිරීමේදි නිරීක්ෂණය වේ. එහිදි පැහැදිලිවම තම සහෝදරියට පහරදුන් බව දක්වා ඇති නමුත් ඇයගෙන් හෝ ප්‍රකාශ සටහන් කිරීමක් සිදුකර නොමැති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන ආකාරයට 2017.07.29 පැය 20.15 ට අත්අඩංගුවට ගෙන 20.35ට පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇති අතර, 2017.07.30 වන දින 02 වන වගඋත්තරකරු පාර්ශවයන් දෙකම කැඳවා පැය 09.30 ට සමථයකට පත් කර ඇති බවට තොරතුරු සටහන් පොත් හි එදින සටහන් අනුව නිරීක්ෂණය වේ.

පැමිණිකරුට ඇප ලබාදී ඇත්තේ 2017.07.30 දින පැය. 15.30 ට බව තොරතුරු සටහන් පොත්වලට අනුව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වගන්තියට අනුව යම් පුද්ගලයෙකුව වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි සීමිත අවස්ථා කිහිපයක් දක්වා ඇත. ඒ අනුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 31:1 (ආ) යටතේ පොලිස් නිලධාරියෙක් විසින් යම් පුද්ගලයෙක් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත්තේ නම් පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් තෘප්ත වී ඇති බවට අත්අඩංගුවට ගනු ලබන්නා විසින් සෑහීමකට පත්විය යුතු වේ.

එනම් "සැකකරු සංඥය වරදකට සම්බන්ධ තැනැත්තෙක් විය යුතු බව, සැකකරුට විරුද්ධව සංඥය වරදක් සම්බන්ධයෙන් සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබීම, සැකකරුට විරුද්ධව සංඥය වරදක් සම්බන්ධයෙන් විශ්වාස කටයුතු තොරතුරක් ලැබී තිබීම හෝ සංඥය වරදකට සම්බන්ධ වූ බවට සාධාරණ සැකයක් මතුවී තිබිය යුතු වීමයි".

එසේම එම කරුණු සත්‍ය විය යුත්තේ යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට පෙර බවද ශ්‍රේෂ්ඨාධිකරණ නඩු මගින් හෙළිදරව් කර ඇත. මෙම කරුණු එකක් හෝ කිහිපයක් තෘප්ත නොවීම මත පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළ යුතු බව ඒ අනුව පෙන්වා දී ඇත. එබැවින් පොලිස් නිලධාරියෙකුගේ නීතිමය වගකීම වන්නේ අත්අඩංගුවට ගැනීමට පෙර විමර්ශන කටයුතු සිදුකර සැකකරුට එරෙහිව 32 : 1(අ) වගන්තියේ ඇති කොන්දේසි තෘප්තිමත් වන බවට වගබලා ගැනීමයි.

මේ අනුව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත්තේ නිසි විර්ශනයකින් තොරව බවට අනාවරණය වන බැවින් වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) සහ 13(2) යන ව්‍යවස්ථා මගින් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් පැමිණිලි පාර්ශවය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. අත්අඩංගුවට ගැනීම තුළින් සිදුවූ අගතිය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුට රු. 25,000/- ක මුදලක් ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම සඳහා මෙහි පිටපත් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2019.09.02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

01 සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 08

02 පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

සැ.යු :- ඉහත මුදල මුදල් ඇණවුමක් මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත යොමුකරන ලෙස වගඋත්තරකරුවන් වෙත දන්වා සිටිමු.

B/R3